---

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 23 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පාලින්දනුවර ප්‍රදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

කර්මාන්ත ගිණුමෙන් සාමාන්‍ය ගිණුමට මාරු කර තිබූ රු.625,000 ක් සාමාන්‍ය මුදල් ගිණුම හර කර කර්මාන්ත මුදල් ගිණුම බැර කර තිබියදී රජයේ ආධාර ණයහිමි ගිණුම හර කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,499,615 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.685,515 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 1,625 | 497 | 45 |
| (ii.) | බදු කුලී | 3,041 | 3,956 | 102 |
| (iii.) | බලපත ගාස්තු | 299 | 204 | -- |
| (iv.) | වෙනත් ආදායම් | 4,444 | 3,991 | -- |

#### 2:2:2 වරිපනම් බදු

2009 වසරේ සිට 2012 වර්ෂය දක්වා ගොඩනැගිලි සැලසුම් 113 ක් අනුමත කර තිබුණද අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් 7 ක් සඳහා පමණි. එම ගොඩනැගිලිවල වරිපනම් තක්සේරුවක කරන තෙක් තාවකාලික තක්සේරුවක් හෝ කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

#### 2:2:3 වෙනත් ආදායම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආපන ශාලා ආදියෙන් 1% ක බදු මුදලක් අයකර ගත යුතු වුවත් 2006 වර්ෂයේ සිට ලියාපදිංචි වී තිබූ නවාඩු නිකේතනයකින් එම බදු මුදල් අය කර ගෙන නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,587,750 |
| (ii) | මුද්දර ගාස්තු | 2,262,472 |

2.3 අවිධිමත් ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී 1 ½" x 8" ප්‍රමාණයේ හියුම් පයිප්ප 11 ක් හා 1 ½" x 4" හියුම් පයිප්ප 11 ක් රු.79,200 කට මිලදී ගෙන තිබුණි. මෙම හියුම් පයිප්ප මිලදී ගැනීමට තිබූ අවශ්‍යතාවය හෝ ඒ පිළිබඳ නිර්දේශ හෝ ඉල්ලීම් හෝ ලිපිගොනුවෙන් අනාවරණය නොවූ අතර මිලදී ගෙන තිබූ සියළුම හියුම් පයිප්ප තාක්ෂණ නිලධාරී නමට නිකුත් කර තිබුණි. නමුත් එකී පයිප්ප කුමන මාර්ගයන් සඳහා යොදා ගත්තේද යන්න සඳහන් නොවීය.

2.4 අයවැයකරණය

ආදායම් විෂයයන් 2 ක හා වියදම් විෂයයන් 5 ක 41% සිට 279% දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක්ද, ආදායම් විෂයයන් 3 ක හා වියදම් විෂයයන් 2 ක 36% සිට 77% දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය වීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

2.5 ප්‍රසම්පාදන සැළැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

---

2.6 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශීය සභා රීති සංග්‍රහයේ 5 රීතියේ 7 උප රීතිය සහ V ප්‍රකාරව මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගැනීම සභාපතිගේ කාර්යභාරයක් වුවද එසේ කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) අයවැයකරණය